ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන - 2012

ළමා සාහිත්‍යය - ESC 2220

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.01.12 වේලාව - ප.ව. 01.30- ප.ව. 04.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද දෙවන කොටසේ ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.

## I කොටස

01. පෙර පාසල්වියේ දරුවන් සඳහා ගැළපෙන ගීතයක තිබිය යුතු ලක්‍ෂණ තුනක් (03) ලියන්න.

02. වයස අවුරුදු තුන - පහ (3-5) අතර දරුවන් සඳහා කතන්දර පොතක් තෝරා ගැනීමේ දී දෙමාපියන් විසින් සැලකිලිමත් වියයුතු කරුණු පහක් (05) ක් ලියන්න.

03. ළමා පද්‍ය සාහිත්‍යය බෙදෙන අනු කොටස් තුන (03) ලියන්න.

04. ළමුන්ට කතන්දර ඇසීමට සැලැස්වීම ඉතා වැදගත් ය. කතන්දර තුළින් දරුවන්ගේ නිර්මාණාත්මක චින්තන කුසලතා වර්ධනය කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. (i) පෙර පාසල් දරුවන්ට ගැළපෙන තේරවිලි තුනක් ලියන්න.

(ii) එම තේරවිලි පෙර පාසල් දරුවන්ට උචිත යැයි ඔබ යෝජනා කිරීමට හේතු තුනක් (03) ක් ලියන්න.

06. දරු නැළවිලි ගී වලට සවන්දීමට පෙර පාසල් වියේ දරුවන්ට අවස්ථාව සැලැස්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

07. "ජනකතා" යනු කුමක්දැයි හඳුන්වන්න.

08. ළමා නාට්‍යය දියුණු කිරීම සඳහා පෙර පාසල් ගුරුවරයෙකු ලෙස ඔබට කළ හැකි දේ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II කොටස

09. (i) ළමා පද්‍ය සාහිත්‍යය යන්න හඳුන්වන්න. (ලකුණු 08)

(ii) පද්‍ය සාහිත්‍යය යොදා ගනිමින් දරුවන්ගේ භාෂා කුසලතා සංවර්ධනය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 12)

10. (i) පෙරපාසල්වියේ දරුවන්ගේ යහපත් ආකල්ප වර්ධනය සඳහා සුදුසු ජාතක කතාවක් නම් කරන්න.
(ලකුණු 03)

(ii) ඔබ එය දරුවන් සඳහා උචිතයැයි යෝජනා කිරීමට හේතු වූ සාධක තුනක් (03) පැහැදිලි කරන්න.
(ලකුණු 07)

(iii) ජාතක කථා මගින් දරුවන්ගේ භාෂා කුසලතා වර්ධනය කළ හැකි ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

11. (i) ළමා සාහිත්‍ය නිර්මාණකරුවන් මුහුණදෙන ගැටලු 5 ක් සඳහන් කර එම ගැටලු කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

(ii) එම ගැටලු අවම කිරීම සඳහා ගැළපෙන විසඳුම් ක්‍රියාමාර්ග යෝජනා කරන්න.
(ලකුණු 10)

12. (i) ජනසන්නිවේදන මාධ්‍යය ළමා මනස පෝෂණය කිරීමෙහි ලා බෙහෙවින් උපකාරී වේ. ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.
(ලකුණු 10)

(ii) අපේ රටේ රූපවාහිනිය තුළින් එම කාර්යය කෙතරම්දුරට ඉටුවන්නේ දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10)

13. පහත මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) රූපවාහිනියෙන් විකාශනය වන කාටූන් වැඩසටහන්
(ii) ළමා කතන්දර ඉදිරිපත් කිරීමේ ශිල්පීය ක්‍රම
(iii) චරිතකතා සහ ළමා කුසලතා වර්ධනය

(ලකුණු 20)

\- හිමිකම් ඇවිරිණි. -